ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1930 අංක 10 දරන රබර් පර්යේෂණ ආඥා පනතේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 ට පටහැනිව වාහන අපහරණයෙන් ලද රු. 2,315,000 ක් මුදල් ප්‍රවාහයේ ලැබීමක් ලෙසට ගැලපීම් කර නොතිබූ අතර මෝටර් රථ ඉවත් කිරීමේ ලාභය වන රු. 2,315,000 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඌනතාවයෙන් අඩුකර තිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වල වටිනාකම අධිගණනය වී තිබුණි.	2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී ආයතනයේ වත්කම් විකිණීමෙන් ලද ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. එසේ වුවත් විගණනයේදී එම මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් නොවිය යුතු බව පෙන්වා දී තිබුනි. එබැවින් 2024 වර්ෂයේ වත්කම් විකිණීමෙන් ලද මුදල මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට කටයුතු කර නොමැත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව කටයුතු කළ යුතුයි. .
(ආ)	ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍රමිති අංක 7හි 92 (අ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන දේපළ පිරියත හා උපකරණවල දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද හා තවමත් භාවිතයට ගනු ලබන රු. 12,695,630 ක් වූ සූර්ය පැනලවල දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	ශ්‍රී.ල.රා.ප්‍ර අංක 07 අනුව දළ ධාරණ අගය(Gross Carrying Amount) ආයතනයේ වත්කම් ප්‍රත්‍යාගණනය කරන තෙක් ගිණුම් වාර්තා වල පෙන්වීමට 2025 වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 අප්‍රේල් 26 මිලදී ගෙන තිබුණු රු. 1,616,950 ක් වූ අතිශය ජල පිරිපහදු පද්ධතිය (Ultrapure Water Purification System) රසායනාගාර වියදම් ලෙස ගිණුම් ගත කර තිබූ බැවින් මණ්ඩලයේ ඌනතාවය එම වටිනාකමින් වැඩියෙන් දක්වා ඇති අතර ජංගම නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් පෙන්වා තිබුණි.	මෙම උපකරණය මිලදී ගැනීමට ඉල්ලුම් කරන අවස්ථාවේදී අදාල පර්යේෂණ අංශය විසින් එය නඩත්තු කාර්යයක් බව වාර්තා කර තිබුන බැවින් අදාල වියදම රසායනාගාර වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුනි. එසේ වුවද විගණන විමසුම මගින් මේ පිළිබඳ විමසීමේදී එය පවතින උපකරණයට අවශ්‍ය තවත් උපකරණයක් බව වාර්තා කර ඇත. එබැවින් මෙම ගිණුම්ගත කිරීමේ දෝෂය 2025 දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුයි.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය			
(i) XII වැනි පරිච්ඡේදය	රබර් පර්යේෂණ ආයතනයේ අනුමත කර නොගන්නා ලද කාර්ය පටිපාටි අත්පොත අනුව එක් වර්ෂයක් සඳහා විධායක ශ්‍රේණිවල නිලධාරීන් සඳහා නිවාඩු දින 58ක් ද අනෙකුත් ශ්‍රේණිවල නිලධාරීන් සඳහා නිවාඩු දින 53ක් ද ලබා දී තිබුණි.	ආයතන සංග්‍රෙය් නිවාඩු පිළිබඳ පරිච්ඡේද අංක 12 අනුව ආයතනයේ නිවාඩු වර්ෂයකට අනියම් නිවාඩු 21 ක් හා විවේක නිවාඩු 24 ක් ලෙස නිවාඩු දින 45 ක් දක්වා 2025.01.01 දින සිට සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත.	ආයතන සංග්‍රහයට අනුකූලව නිවාඩු අනුමත කළ යුතුය.

	(ii) XV පරිච්ඡේදයේ 4:7 වගන්තිය	අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු ලබා විදේශගත වී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් වර්ෂ 02 සිට වර්ෂ 34 දක්වා කාලයක් තුළ මණ්ඩලයට අයවිය යුතු එකතුව රු.3,876,552 ක් 2024 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගෙන නොතිබුණි.	බැඳුම්කර කොන්දේසි කඩ කල බී.පී. වීරරත්න හා තුරුල් වර්ණකුල යන අයගෙන් අය විමට ඇති රු. 2,761,932 ක මුදල අය කර ගැනීම සඳහා ගත හැකි නෛතික ක්‍රියාමාර්ග පිළිබඳව නීතිපතිගෙන් උපදෙස් ඉල්ලා ඇත. එසේම නිලධාරි දෙදෙනෙකු දැනට ගෙවීමට ඇති ශේෂය වාරික වශයෙන් ගෙවනු ලබයි.	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන් ගෙන් අදාළ මුදල් අයකර ගත යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 751	ලැබෙන සියලුම භාණ්ඩ, වහාම බඩු ලේඛන පොතෙහි ඇතුළත් කල යුතු වුවත් රසායනාගාර සඳහා මිලදී ගනු ලබන බීකර ඇතුළු වීදුරුමය පරීක්ෂණ උපකරණ සහ රසායනික ද්‍රව්‍ය සඳහා තොග ලේඛනයක් හා පාරිභෝජන ද්‍රව්‍ය ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.	සියළුම දෙපාර්තමේන්තුවල පර්යේෂණ නිළධාරීන් වෙත තොග ලේඛනයක් හා පාරිභෝජන ද්‍රව්‍ය ලේඛනයක් නඩත්තු කිරීම සිදු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව තොග ලේඛනයක් හා පාරිභෝජන ද්‍රව්‍ය ලේඛනයක් නඩත්තු කළ යුතුය.
(ඇ)	2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ	(i) සභාපතිවරයාට රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ සහිතව අදාල රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ඇතිව, දරන ලද සත්‍ය ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කළ හැකි වුවද සභාපති විසින් ආයතනයේ ඇණවුම් මගින් ඉන්ධන ගැනීම නිසා එය ආයතනයේ වියදම්වලට එකතු වී තිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවතින නීති රීති වලට අනුකූලව ක්‍රියාකර කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ නිසි අනුමැතිය ලබා ගන්නා ලෙසට නිර්දේශ කර ඇත. එමෙන්ම මින් පසුව පැවැති 2024.08.21 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා සභාපතිතුමා විසින් භාවිතා කරන ලද අතිරේක ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණ සම්බන්ධ මණ්ඩල පත්‍රිකාවන් යොමු කර නොමැත.	ලබා දී ඇත චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

		(ii) අදාල චක්‍රලේඛය පරිදි අමතර ඉන්ධන ලබා ගැනීම සඳහා පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	සභාපතිතුමා විසින් අමතර ඉන්ධන ලබා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශීය ලේකම්තුමාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොමැත.	අමතර ඉන්ධන ලබා ගැනීම සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතුය.
(ඇ)	ඉහත චක්‍රලේඛයේ 3.5 ඡේදය	නිල වාහනයක් වෙන් කර ඇති නිලධාරියකුට වෙනත් කාර්යාලීය වාහනයක් භාවිතා කිරීමට හිමිකමක් නොමැති වුවත්, සභාපති වෙත වෙන්කළ වාහනයක් සහ ඉන්ධන දීමනාව ලබාගෙන තිබියදීත් 2024 මැයි 29 දින වැඩබලන අධ්‍යක්ෂතුමාගේ උපදෙස් පරිදි ඩාර්ටන්ෆීල්ඩ් ප්‍රධාන කාර්යාලයේ තිබුණු අංක PD-2787 දරන ඩබල් කැබ් රථය සභාපතිතුමාගේ රාජකාරි කටයුතු සඳහා ලබා දී තිබුණි. ඒ අනුව 2024 මැයි 29 සිට 2024 ඔක්තෝබර් 11 දක්වා කාලය තුලදී දින 40කදී කිලෝමීටර් 4,566 ක දුරක් සඳහා මෙම රථය සභාපතිතුමාගේ රාජකාරි කටයුතු සඳහා භාවිතා කර තිබුණු බව ධාවන සටහන් පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.	හිටපු සභාපතිතුමා විසින් එවකට සිටි වැඩබලන අධ්‍යක්ෂතුමා වෙත සිදු කර ඇති වාචික ඉල්ලීම පරිදි 2024 මැයි 29 දින වැඩබලන අධ්‍යක්ෂතුමා විසින් ප්‍රවාහන අංශය වෙත ලබා දී ඇති උපදෙස් පරිදි ඩාර්ටන්ෆීල්ඩ් ප්‍රධාන කාර්යාලයේ තිබුණු අංක PD – 2787 දරන ඩබල් කැබ් රථය රබර් පර්යේෂණ මණ්ඩලයේ සභාපතිවරයාගේ භාවිතය සඳහා ලබා දී ඇත.	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ඉ)	2018 ජනවාරි 24 දිනැති 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන ආයතනික යහපාලනය පිළිබඳ අත්පොතෙහි 3 පරිච්ඡේදය	රබර් පර්යේෂණ මණ්ඩලය විධිමත් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.	රබර් පර්යේෂණ මණ්ඩලය සඳහා විධිමත් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා ආයතනයේ අභ්‍යන්තර කමිටුවක් වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) ගේ ප්‍රධානත්වයෙන් පත් කර ඇති අතර, කඩිනමින් මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.	අදාල චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක්ද සකස් කළ යුතුය.

(ඊ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයෙහි 6.7 ඡේදය	සියළුම වත්කම් සඳහා වාර්ෂික සත්‍යාපනයක් සිදුකළ යුතු වුවත් මණ්ඩලය 2024 දෙසැම්බර් 31දිනට ආයතනය සතු වූ වාහන සඳහා එවැනි සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.	2024 වර්ෂයේ වාහන ඇතුළු වත්කම් සමීක්ෂණ කටයුතු දැනට සිදුකරනු ලබන අතර සමීක්ෂණ කටයුතු නිම වූ පසු වාර්තා විගණයට ඉදිරිපත් කරනු ලැබේ.	මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.120,923,726 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.70,609,994 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.50,313,732 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ ප්‍රදාන 68,158,012 කින් හා වෙනත් ආදායම් රු.9,561,230 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 **ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

අයිතමය	සමාලෝචිත වර්ෂය	ඉකුත් වර්ෂය	ඉකුත් වර්ෂය සමඟ වෙනස් වීම	වෙනස්වීමේ ප්‍රතිශතය
	රු.	රු.	රු.	යයට
රජයේ ප්‍රදාන	444,209,443	512,367,455	(68,158,012)	(13)
වෙනත් ආදායම්	37,972,808	47,534,038	(9,561,230)	(20)
විලම්භිත ආදායම්		-		
වතු ආදායම්	119,937,401	117,584,111	2,353,290	2
වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ	373,984,958	354,446,535	19,538,423	6
සැපයුම් හා පරිභෝජන වියදම්	38,963,837	41,862,017	(2,898,180)	(7)
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	127,053,972	163,536,107	(36,482,135)	(22)
වෙනත් වියදම්	120,945,903	131,018,063	(10,072,160)	(8)

2.3 **අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 2.9:1 ක් හා 2.3:1ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එම අගයන් පිළිවෙලින් 5:1ක් හා 4:1ක් විය. ජංගම වත්කම් රු. 40,312,827 කින් අඩුවීම හා ජංගම් වගකීම් රු.8,688,235 කින් වැඩිවීම, ජංගම අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය පිරිහීමට හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
රු.130,000 ක් වටිනා අංක 45-8703 දරන ට්‍රේලර් බවුසරය 2024 සැප්තැම්බර් 25 දිනට වාහන විස්තර ලබා ගැනීමේ දී අලුත්වැඩියා තත්ත්වයේ පවතින බව දක්වා තිබුණි. එහෙත් මෙම ට්‍රේලර් බවුසරය වතු අංශය මගින් අබලි යකඩ ලෙස විකුණා ඇති බවට වාර්තා වී ඇත. විගණන දිනය වූ 2024 නොවැම්බර් 04 දින වන විටත් මේ සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 104(1) පරිදි කටයුතු කර නොතිබුණි.	මේ සඳහා ගණකාධිකාරී විසින් විමර්ශනයක් සිදු කර 2025.03.28 දිනැතිව විමර්ශන වාර්තාව ඉදිරිපත් කර ඇත. එම විමර්ශන වාර්තාව 2025.05.05 දින පැවති විගණන හා කළමණාකරන කමිටු රැස්වීමට ඉදිරිපත් කල අතර, විමර්ශන වාර්තාව සලකා බැලීමේදී සිදු වී ඇති සමස්ථ ක්‍රියාවලිය තුල වගකිව යුතු නිළධාරීන් කවුරුන්ද යන්න සම්බන්ධව සෘජු නිර්දේශයක් ලබා දී නොමැති බව දන්වා ඇත. ඒ අනුව මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණ වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙස විගණන හා කළමණාකරන කමිටු රැස්වීමේදී උපදෙස් ලබා දී ඇති බැවින්, 2025.06.23 දිනැති මැමෝ පත මගින් ජොෂ්ඨ ගණකාධිකාරීව දැනුවත් කර ඇති අතර, මෙතෙක් අදාල වාර්තාව ලබා දී නොමැත.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රබර් අපනයන ආදායම ඉහල නැංවීමේ අපේක්ෂාවෙන් 2017 වර්ෂයේ අයවැය සාකච්ඡාවට අනුව, රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය හරහා ව්‍යාපාරික ආකෘතියක් ලෙස රබර් නිෂ්පාදන සැලසුම් කිරීම සහ කාර්යසාධනය ඇගයීම සඳහා අංශුමාත්‍ර පරිමිත සේවාකරණ මධ්‍යස්ථානයක් (FEAS CENTER) පිහිටුවීම සඳහා රු.මි. 49.7 ක් භාවිතාකර 2019 වර්ෂයේදී එම මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කර තිබුණද 2023 ඔක්තෝම්බර් මාසයේ සිට එනම් වසර දෙකකට ආසන්න කාලයක සිට මධ්‍යස්ථානයේ කාර්යයන් සම්පූර්ණයෙන්ම නවත්වා තිබුණු බැවින්	අංශුමාත්‍ර පරිමිත සේවා කරන මධ්‍යස්ථානයේ ප්ලාස්ටික් හා රබර් ආයතනය එක්ව ගිවිසුමක් යටතේ මෙහෙයුම් කටයුතු 2018.08.23 දින සිට 2023 දක්වා සිදු කර ඇත. මෙම මෙහෙයුම් කටයුතු වලින් ප්ලාස්ටික් හා රබර් ආයතනය ගිවිසුම අවසන් වීමත් සමඟ ඉවත් වී ඇත. එබැවින් මෙම තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර මධ්‍යස්ථානයේ කටයුතු නැවත සක්‍රිය කිරීම සඳහා අභිලාශ ප්‍රකාශ කිරීම් කැඳවීම සඳහා අනුමැතිය ලබා ගෙන	ආයතනයේ කාර්යයන් නිසි අධ්‍යයනයකින් යුතුව විධිමත් ලෙස සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතුය. එමෙන්ම නිෂ්කාර්ය වත්කම් ඵලදායී කාර්යයකට යොදාගත යුතුයි.

	අදාල ගොඩනැගිල්ල හා රු. 38,918,694 ක් පිරිවැය වූ පරිගණක හා මෘදුකාංග, යන්ත්‍ර, ලීබඩු හා කාර්යාල උපකරණ සියල්ල නිශ්කාර්යව පැවතුණි.	ඇත.මෙයට සමගාමීව මෙම මධ්‍යස්ථානයේ පවතින උපකරණ පිළිබඳ තත්ත්ව වාර්තාවක් ලබාගැනීමට කටයුතු කර ඇති අතර මෙම තොරතුරු වලට අනුකූලව අභිලාශ ප්‍රකාශ කිරීම් කැඳවා සුදුසු පාර්ශ්වයන් සමඟ මෙහෙයුම් කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.	
(ආ)	රබර් පර්යේෂණ මණ්ඩලය විසින් සිදුකරනු ලබන පර්යේෂණවල සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් ප්‍රධාන පර්යේෂණ ලේඛනයක් නඩත්තු කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.	සියලු පර්යේෂණ වල සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් ප්‍රධාන පර්යේෂණ ලේඛනය සඳහා ආකෘතියක් පර්යේෂණ සමාලෝචන පිළිබඳ උප කමිටුව මගින් ලබාගැනීමටත් 2025 වර්ෂයේ සිට පර්යේෂණ කටයුතු වලට අදාල තොරතුරු ඇතුලත් කිරීමටත් පියවර ගනු ලැබේ. එසේම මෙයට සමගාමීව පසුගිය පර්යේෂණ වාර්තා වල සවිස්තරාත්මක තොරතුරු මෙම ලේඛනයට ඇතුලත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.	රබර් පර්යේෂණ මණ්ඩලය විසින් සිදු කරන ප්‍රධාන පර්යේෂණ ඇතුළත් ලේඛනයක් පවත්වා ගත යුතුය.
(ඇ)	2022 වර්ෂයේ කුරුවිට වතුයායේ කහ වගාකිරීමේ වැඩසටහනක් ආරම්භ කර ඒ සඳහා අමුද්‍රව්‍ය පිරිවැය හා ශ්‍රම පිරිවැය සඳහා රු. 1,659,131 ක් ලෙස වියදම් කර රු. 209,840 ක් ආදායම් ලෙස ලබා ගෙන තිබුණි. කහ අස්වැන්න නිසි ප්‍රමිතියකින් තොරව කහ කුඩු බවට පත් කිරීම හේතුවෙන් කහ කුඩු වල පැහැය වෙනස් වී තිබුණු අතර විගණන දින වන විට කහ කුඩු කල් ඉකුත් වීමට ආසන්න තත්ත්වයේ පැවතීම මත කහ කුඩු කිලෝග්‍රෑම් 205ක් අලෙවි කර ගැනීමට නොහැකිව තිබුණි.	සුදුමුල් රෝගය වැළදුන බිමක නැවත රබර් වගා කිරීම සඳහා එම භූමියේ රෝග කාරකය ඉවත් වන තෙක් වෙනත් තාවකාලික භෝග වගා කිරීම සිදු කරනු ලැබේ. ඒ අනුව කුරුවිට වතු යායද කහ වගා කොට ඇත්තේ ලාභ ඉපයීමේ අරමුනින් නොව රබර් වගාවට සුදුසු ලෙස භූමිය සකසා ගන්නා තෙක් අතුරු භෝගයක් ලෙසය. දැනට තොගයේ පවතින කිලෝ ග්‍රෑම් 205 ක ප්‍රමාණය මෙම වසර අවසාන වීමට ප්‍රථමව විකිණීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.	වැඩසටහනක් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් කර සාර්ථකව වැඩසටහන් අවසන් කල හැකි පරිදි සැලසුම් සකස් කළ යුතුයි.
(ඈ)	රබර් පර්යේෂණ මණ්ඩලයට අයත් කළුතර,රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්ක වල පිහිටා ඇති ඉඩම් 38 ක් සම්බන්ධයෙන් පිඹුරුපත් අංක/ඔප්පු අංක මේ දක්වා සොයාගෙන නොතිබුණු අතර ඉඩම් 15ක් සම්බන්ධයෙන් හිමිකාරිත්වය සනාථ කිරීමට අවශ්‍ය	1994.06.27 දින කැබිනට් තීරණයකට අනුව රබර් පර්යේෂණ මණ්ඩලය යටතේ පැවති උපදේශන සේවා දෙපාර්තමේන්තුව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කර ඇත. මෙම	ඉඩම්වල අයිතිය පවරා ගැනීමේ හෝ පවරා දීමේ කටයුතු කඩිනම් කළ යුතු අතර අයිතිය සනාථ කිරීමට අවශ්‍ය ලිපිලේඛන ලබා

	ලිපිලේඛන රබර් පරියේෂණ මණ්ඩලය සතුව නොතිබුණි.	ඒකාබද්ධ කිරීමත් සමඟ ඉඩම් ගොඩනැගිලි ආයතන දෙකෙන්ම භාවිතා කරන අතර මෙහි ඉඩම් පැවරීමට සම්බන්ධ ක්‍රියාවලිය විධිමත්ව සිදු වී නොමැත. එබැවින් ආයතන දෙක එක්ව 2024 12.19 දින සාකච්චා කර සවිස්තර වාර්තාවක් ලබා දෙන ලෙස දන්වමින් 2025.04.10 දින රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇත. මෙම තොරතුරු අනුව ඉඩම් ගොඩනැගිලි වල අයිතිය පැවරීමේ කටයුතු විධිමත් කිරිමට කටයුතු කරනු ලැබේ.	ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	රබර් පර්යේෂණ මණ්ඩලයට අයත් ඉඩම් සහ ගොඩනැඟිලි 43කට අධික ප්‍රමාණයක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව භාවිත කරනු ලබන අතර මෙම ඉඩම් බදු ගිවිසුමක් යටතේ ලබා දීමක් හෝ පැවරීමක් සිදු කර නොතිබුණි. තවද රබර් පර්යේෂණ මණ්ඩලය විසින් භාවිතා කරමින් පවතින මොනරාගල කුමාරවත්ත හා අලව්ව නාරම්පොලවත්ත යන වතු මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	-එම-	මණ්ඩලයට අයත් ඉඩම් සහ ගොඩනැඟිලි වල අයිතිය නිරවුල් කර ගත යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමඟ 2017 වර්ෂයේදී ගිවිසුම්ගතව 2022 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබුණු කුඩා රබර් ඉඩම් හිමියන් සඳහා ජීව ඉන්ධන දැව වර්ග හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘතියෙහි කාර්යයන් සාර්ථකව නිම නොකිරීම හේතුවෙන් ඒ සඳහා ලැබී තිබුණු රු. 10,457,200 ක මුදලින් 2024 දෙසැම්බර් 31 දින වන විටත් රු. 4,283,644 ක් එනම් සියයට 40 ක මුදලක් ඉතිරිව තිබුණි.	එක්සත් ජාතින්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමඟ අත්සන් කරන ලද ගිවිසුම අනුව ලැබී තිබුනු මුදලින් රු4,283,644 ක් ඉතිරිව ඇත. එම මුදල් භාවිතා කොට ගිවිසුම අනුව නිම කරන ලද කටයුතු සඳහා ගෙවීම් සිදු කල යුතු වේ. එසේ වුවත් අදාල තොරතුරු පරික්ෂා කොට ගෙවීම් කර නොමැති බැවින් ගෙවිය යුතු රබර් ගොවීන්ගේ හා ආයතන නිලධාරින්ගේ මුදල් හඳුනාගැනීම සඳහා 2025.05.06 දින කමිටුවක් පත් කර ඇති අතර එමගින්	ගිවිසුම්ගත කාර්යයන් අදාල කාලය තුලදී සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය

		ලැබෙන නිර්දේශ අනුව කටයුතු කරනු ලැබේ.	

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ටයර් මධ්‍යස්ථානයට අයත් 2020 වර්ෂයේදී ස්ථාපනය කර තිබුණු රු. 20,034,200 ක් වටිනා ගෑස් ක්‍රෝමාටෝග්‍රැපි-මාස් ස්පෙක්ටෝමෙට්‍රි (Gas Chromatography- Mass Spectrometry) (GC-MS) උපකරණය සහ රු. 15,950,000 ක් වටිනා ICP-OES උපකරණ පසුගිය වර්ෂවලදී අවස්ථා 111 කදී පමණක් සාම්පල් පරීක්ෂා කිරීම සඳහා භාවිතා කර තිබුණු අතර මෙම උපකරණ 02 මිලදී ගැනීමෙන් අපේක්ෂා කළ පරිදි මණ්ඩලයට ආදායම් ජනනය කිරීමට නොහැකි වී තිබුණි.	මෙම උපකරණ දෙක මිලදී ගැනිමේ අරමුණ වන්නේ රබර් හා රබර් භාණ්ඩ වල ඇති සංයුතිය (බැර ලෝහ අයන හා බහු ඇරෝමිතික සංයෝග ආදිය) පිලිබඳ පරීක්ෂා කිරීම දේශිය හා අන්තර් වෙලඳපොලට අවශ්‍ය උසස් තත්වයෙන් යුතු රබර් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදි අවශ්‍ය වන පර්යේෂණ හා සේවා සැපයිම වේ. මෙම සේවා සැපයීමේදි ඒ සඳහා වැය වන අවම ගාස්තු අයකර ගනිමින් ශ්‍රී ලංකා කර්මාන්ත කරුවන්ට මෙම සේවාවන් සැපයීම තුළින් විදේශ රට වලට යැවිමේදි දැරිමට සිදු වන අධික වියදමත් කල්ගත වීමත් වැලැක්විමද මෙම උපකරණ මිලදි ගැනිමේ අරමුණකි. එම නිසා මිලදී ගැනිමේ පරමාර්ථය වන්නේ ආදායම් ජනනය කිරීම පමණක් නොවන අතර පර්යේෂණ කටයුතු සහ සේවා සැපයීමද වේ.	මිලදී ගත් උපකරණ සැලසුම් කළ පරිදි උපරිම ඵලදායීතාවයෙන් යුතුව භාවිතයට ගත යුතුය.
(ආ)	2014 වර්ෂයේ රු.4,052,300 ට මිලදීගෙන තිබුණු මූනි විස්කෝමීටරය (Mooney Viscometer) යන්ත්‍රයේ මෘදුකාංග දෝෂයක් හේතුවෙන් 2018 වර්ෂයේ සිට විගණිත දින දක්වා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර ආයතන පරිශ්‍රයේ නිෂ්කාර්යව රඳවා තබා තිබුණි.	සැපයුම්කරු වෙත දිගින් දිගටම මෙය නිවැරදි කිරිමට කරන ලද අතර ප්‍රතිචාර නොලැබුන බැවින් වෙනත් ආයතනයක දැනුමැති නිලධාරියකු මගින් මෙය නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ.	අළුත්වැඩියාවන් නිසි පරිදි සිදු කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ආයතනයේ කළමනාකරණ සහකාර සේවය සහ රසායනාගාර සහකාර රාජකාරී සඳහා දෛනික වැටුප් ලබන වසර 01 සිට වසර 23 දක්වා සේවා කාලයක් සහිත නිලධාරීන් 32 ක් මණ්ඩලයට අනුයුක්තව සේවයේ යොදවා තිබුණි.	වතු දෙපාර්තමේන්තුවේ සේවයේ අවශ්‍යතාවය මත චෙක්රෝල් සේවකයින් බඳවා ගන්නා අතර, ඔවුන්ගේ සියලු කටයුතු වතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර, අවශ්‍යතාවයකදී පමණක් වතු දෙපාර්තමේන්තුවේ සේවයෙන් දෛනික අවශ්‍යතාවය මත ආයතනයට යොදවා ගනු ලැබේ.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය.

3.6 වාහන පද්ධති කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලය විසින් මිලදී ගෙන තිබුණු WP/CAO/3470 හා WP/NC/5811 අංක දරණ වාහනවල ලියාපදිංචි සහතිකය සභාපති, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය ලෙස දැක්වෙන බව නිරීක්ෂණය විය.	මේ වන විට මෙම රථ දෙකෙහි අයිතිය සභාපති නමින් ලියාපදිංචි ඇත. නමුත් මෙහි අයිතිය ආයතන ප්‍රධානී, වන අධ්‍යක්ෂ සතු විය යුතු අතර, අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය (Director, Rubber Research Institute of Sri Lanka, Dartonfield, Agalawatta) නමින් ලියාපදිංචි වෙනස් විය යුතුය. එබැවින් මෙහි ඉදිරි කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා 2025.07.25 දින පැවැත්වීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.	වාහනවල ලියාපදිංචි සහතිකය මණ්ඩලයේ නමට ලබා ගත යුතුය.

4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 වාර්ෂික වාර්තාව

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 05ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ වාර්ෂික වාර්තාව මේ දක්වා සභාගත කර නොතිබුණි.	2024 වර්ෂයට අදාල වාර්ෂික වාර්තා කෙටුම්පත 2025.03.24 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන්නට යෙදුනි. අංක MPI/R/03/RRI–Annual Report 01 හා 2025.06.20 දිනැති ලිපිය මඟින් අප වෙත දැනුම් දෙන්නට යෙදුනේ 2024 වාර්ෂික වාර්තාව 01/2021 පොදු ව්‍යවසායක චක්‍රලේඛනයට අනුව සකස් කොට අමාත්‍යාංශය වෙත කඩිනමින් යොමු කරන ලෙසයි. 2024 වාර්ෂික වාර්තා කෙටුම්පතේ මෘදු පිටපත් අවශ්‍ය කටයුතු සඳහා 2025.09.18 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව දන්වා සිටිමි.	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව නියමිත පරිදි වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු.

4.2 සංයුක්ත සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අත්පොතේ 2.3 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතු වුවත් මණ්ඩලය විසින් 2024 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2023 වසර දක්වා සංයුක්ත සැලැස්ම සකස් කර ඇත. 2025-2028 සඳහා සංයුක්ත සැලැස්ම සකස් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අත්පොතේ වගන්තිය ප්‍රකාරව අඛණ්ඩව සංයුක්ත සැලැස්ම සකස් කළ යුතුය.

4.3 විගණන කමිටුව

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අත්පොතේ 4.2 වගන්තිය ප්‍රකාරව මාස 03කට වරක් ලෙස වසරකදී විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි.	විගණන හා කළමනාකරණ කමිටු සංයුතියේ වරින් වර ඇති වූ සංශෝධන නිසා දෙවන කාර්තුව තුල පැවැතීමට නොහැකි විය. තෙවන කාර්තුව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය පත් නොකිරීම මත රැස්වීම පැවැතීමට ද කටයුතු කළ නොහැකි විය.	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අත්පොතේ වගන්තිය ප්‍රකාරව නියමිත පරිදි රැස්වීම් පැවැත්විය යුතුය.